
**පිළිසඳර**

**කේ. එම්. පී. රාජරත්න**

# ශ්‍රීලංකාවේ අද සිදුවන දෙය එදා පැහැදිලිව දුටු දේශපාලකයා ඔහුය


රාජරත්න මහතා අද


කේ. එම්. පී. රාජරත්න මහතා (පින්තූරයේ මැද මල් මාලාවක් පැළඳ) 1958 දී හිරෙන් නිදහස් වී පැමිණි දා ආධාරකරුවන් ද පිරිවරා මුලින්ම ගියේ මුතියංගන මහා විහාරයේ පූජාවකට සහභාගි වීමටය. වම්පසින් ඔහු ළඟම සිටින්නේ බිරිඳ, කුසුමා රාජරත්න මහත්මියයි.

**ශ්‍රී** ලංකාවේ වත්මන් දේශපාලනික, ආර්ථික හා සමාජීය අර්බුදයන්ට පාදක වී ඇත්තේ උතුරේ කොටි ත්‍රස්තවාද ව්‍යාපාරයයි. මෙහි මූලාරම්භය පිළිබඳවත්, ප්‍රජාතන්ත්‍රවාදී නොවන දේශපාලන අරගලයකට දෙමළ ජනතාව ඇදී ආ අයුරු පිළිබඳවත් අවබෝධයක් ලබාගැනීම කාලෝචිත ය.

උතුරේ කවදා හෝ ද්‍රවිඩ ත්‍රස්තවාදී ව්‍යාපාරයක් ඇතිවී ශ්‍රීලංකාවේ ආණ්ඩුවට තර්ජනයක් වන පරිදි හැසිරෙනු ඇතැයි තුන්කල් නුවණින් යුතුව අඩසිය වසරකට පෙර සිට දේශපාලන කරළිය තුළ ප්‍රබල හඩක් නැගූ ප්‍රධාන පෙළේ දේශපාලනඥයෙකු සමග පිළිසඳරක යෙදීමට මම ඉඩ ප්‍රස්ථාව ලදිමි. එතුමා නම් දැනට 81 වියෙහි පසුවන, වැලිමඩ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාවූද, 1956 බණ්ඩාරනායක රජයේ උප ඇමතිවරයෙකුවූ ද, 1965 ඩඩ්ලි සේනානායක රජය යටතේ සෙනෙට් මන්ත්‍රීවරයෙකු වූ ද, ජාතික විමුක්ති පෙරමුණ නම් දේශපාලන පක්ෂයෙහි (සල කුණ- අහස්යානය, වර්ණය - කහ, කෙටි නම ජේ. වී. පී.) නායකයාවූ ද, අධිනීතිඥ, කෝනාර මුදියන්සේලාගේ පොඩිඅප්පුහාමි රාජරත්න නොහොත් සමස්ත ශ්‍රීලංකාවම හඳුනන පරිදි කේ. ඇම්. පී. රාජරත්න මහතායි.

තම බිරිඳ වූ, හිටපු උප ඇමතිවරියක ද වන කුසුමා රාජරත්න මහත්මියගේ අකල් වියෝව නිසා තරමක තනිකම සංවේගය දරාගෙන සිටින්නේ වුවද කොළඹ පිටකෝට්ටේ එතුමන්ගේ නිවසේදී නොබෝදා ලංකාවිත්ති වෙනුවෙන් හමුවීමට වාසනාව ලද්දෙමි.

ඔහු වයෝවෘධ ය. ගමන හා හැසිරීම දුබල වුව ද කටහඬ දුබල නැත. අදහස් වේගවත් ය. ඒවා එදා මෙන්ම අදටත් වළංගුය. ටිකින් ටික ඔහුගේ කටහඬ අවදිවුණේ මෙසේ ය.

" මං ඉපදුණේ 1927, වැලිමඩ, දිවිතොටවෙල ගමේ. අපේ ගම වටේටම තියෙන්නෙ තේ වතු. මේ තේවතු වවාගන්න ඒවායේ පාරවල්, පස්වැටි, කානු ආදිය හදන්න වැඩ කළේ ඒ ගම්වල සිංහළ අය. ඒ අයගේ ජීවිකාව වුණේ වත්තෙ වැඩකිරීමයි. තේවතු වවලා, දැඩිවෙලා, දළු කැඩෙන කොට මුලින් වැඩ කරපු සිංහළ අය අයින් කරලා, දෙමළ අය ගෙන්නලා වත්තෙ වැඩ දුන්නා. ආර්ථික විද්‍යාව අනුව කියනවා නම් වත්ත හදන්න සිංහළ ශ්‍රමය, වත්තෙ දළු ටික කැඩිලා ආදා-යම එනකොට ඒවා දෙමළ අයට. ඒ විතරක් ද? පස්සෙ ලැබුණු වරප්‍රසාද? පුරවැසි-කමත් ලැබුණා. අද බොහෝ දේශපාලකයන් ඔවුන්ගේ අල්ලේ නැටවෙනවා. මම විරුද්ධවුණේ ඔය කාරණා වලට. ඒක වැරැද්දක්ද? "

කේ. එම්. පී. රාජරත්න, වැලිමඩ දඹවින්නේ පාසැලෙන් හා මහනුවර ධර්මරාජ සහ බදුල්ලේ ඌව විද්‍යාල වලින් මූලික අධ්‍යාපනය ලැබ, කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉගෙනගත්තේ ය.

1946 දී ලංකාවට නව ආණ්ඩු ක්‍රමයක් සැකසීමට සෝල්බරි සාමිවරයා අයිවර් ජෙනිංන්ග්ස් සමග ලංකාව පුරා යමින් ජනතාවගේ අදහස් ලබාගත්තේය. සෝල්බරි කොමිසම බදුල්ලට පැමිණි වෙලාවේ දී එවකට 19 වියේ සිටි රාජරත්න ඔවුන් ඉදිරියේ පළකළ අදහස් මහා දේශනයක් බඳුවීය. මන්ත්‍රී කොට්ඨාශ බෙදීමේදී භාෂාව හා ජාතිය සාධකයක් කර නොගන්නා ලෙසද, ශ්‍රීලංකාව කුමන දිනයේ වුවද බෙදා ගැනීමට අර අඳින අදහස් වලට අවනත නොවිය යුතුයයිද ඔහු ස්ථිර වේගවත් අයුරින් ප්‍රකාශ කර ඇත. මේ පිළිබඳව එදා ලංකාදීප පත්‍රයේ මුල් පිටුවේ පළවූ වාර්තාව දුටු එවකට ආනන්ද ශාස්ත්‍රාලයේ විදුහල්පති ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම්, රාජරත්නට අවවාද කර ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ගමන ඉක්මන් නොවිය යුතු බව කීමෙනි. උදාහරණයක් ලෙස මහනුවර කෝච්චිය ඕනෑවට වඩා හයියෙන් ගියොත් රඹුක්කන කන්ද නැගගන්න බැරිව නවතින බවද අදිකාරම් මහතා දක්වා ඇත.

1931 මුල්වරට සර්වජන ඡන්දය යටතේ ලංකාවේ පැවති මැතිවරණය උතුරේ දේශපාලයන් විසින් වර්ජනය කරන ලදී. එයට හේතුව වූයේ ඡන්ද බල ප්‍රදේශ වෙන්කිරීමේදී භාෂාව හා ජාතිය සාධකයක් ලෙස නොගැනීමයි. මෙම මැතිවරණ වර්ජනය උතුරේ දෙමළ නායකයන් ශ්‍රීලංකා රජයට එල්ල කළ ප්‍රථම දේශපාලන අභියෝගයයි.

1936 දී ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, ඩී. ඇස්. සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, සී. ඩබ්.ඩබ්. කන්නන්ගර වැනි පිළිගත්, වියත් අයගෙන් සැදි ඇමති මණ්ඩලය, සිංහළ පමණක් වූ ඇමති මණ්ඩලය කැයි දෙමළ නායකයෝ පරිභව කළහ. 1948 දී ජී. ජී. පොන්නම්බලම්ගේ සුප්‍රසිද්ධ පණහට පණහ යෝජනාව, එනම්, පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව සිංහළ හා අනෙකුත් ජාතීන් අතරේ අනුපාතය 50% වශයෙන් විය යුතුයයි යෝජනා කළේය.

1951 දී එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක තම සමාජවාදී හා දේශීය දේශපාලන මතවාද ඔස්සේ සකසාගත් දර්ශනය මහජනතාවට එළිදැක්වීමේදී එම අදහස් පිළිගන්නා වියතුන් කථිකයින් ලෙස යොදාගැනිණ. එවකට ශ්‍රීලංකා විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය සංගමයේ සභාපතිවූ ද, ඌවේ ප්‍රථම විශ්වවිද්‍යාලීය ශිෂ්‍යයාවූ ද, කේ. එම්. පී. රාජරත්න මේ සඳහා ආරාධිතයෙකු ලෙස සහභාගිවිය.

සිංහළ භාෂාව රැකගැනීම, සිංහළ සංස්කෘතිය නගා සිටුවීම, සිංහළ උගතුන් රජයේ රැකියාවලට බඳවා ගැන්ම මෙන්ම, දේශීය බව අධ්‍යාපන ධාරාවන්ට අන්තර්ගත කිරීම රාජරත්නගේ අභිලාෂය වීය.

**අපි එදා එහෙම සටන් කරපු නිසා තමයි අද සිංහලකම තියෙන්නෙ. සිංහල රටක් තියෙන්නෙ. ඒ දවස්වල රජයේත්, පෞද්ගලික අංශයේත්, ව්‍යාපාරික අංශයේත් මුල් තැන සිංහළයාට තිබුණේ නැහැ. උතුරේ ද්‍රවිඩ පිරිස් ටික ටික ද්‍රවිඩ ආධිපත්‍යය ගොඩනැගුවා. අපි ඒවට විරුද්ධවුණා.**

" රජයේත්, පෞද්ගලික අංශයේත්, ව්‍යාපාරික අංශයේත් මුල් තැන සිංහළයාට තිබුණේ නැහැ. උතුරේ ද්‍රවිඩ පිරිස් ටික ටික ද්‍රවිඩ ආධිපත්‍යය ගොඩනැගුවා. අපි ඒවට විරුද්ධවුණා. "

රාජරත්න මහතා කියයි.

1956 දී සිංහළ භාෂාව පැය 24 න් රාජ්‍ය භාෂාව කරනවයි කියලා පොරො-න්දු වුණු බණ්ඩාරනායක අගමැතිවිය. කේ. එම්. පී. රාජරත්න එම රජයේ උප ඇමතිවරයෙකු විය.

" පොරොන්දු වුණු විදියට සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරන්න ප්‍රමාද වෙනකොට අපි විරුද්ධ වුණා. රජයේ විභාගවලට දෙමළ භාෂාවෙන් පෙනී සිටින්න ඉඩදීම හා දෙමළ භාෂාව අන්තර් භාෂාවක් ලෙස පිළිගැනීම ගැන මම විරුද්ධවුණා. සිංහලෙන් එස්. එස්. සී. සමතුන් රජයේ රැකියාවලට යාමට පෙර ඉංග්‍රීසි අනිවාර්ය කළා. ඒ විතරක් නෙවෙයි උතුරේ නායකයෝ තම දෙමළ ආධිපත්‍යය නැගණහිර පළාතටත් පුළුල් කළා. වෙල්වනායගම් යාපනයේ ඉඳලා මඩකලපුවට පා ගමනක් සංවිධානය කළා. චෙල්වා- බණ්ඩාරනායක ගිවිසුම් සකස් කළා. "

සිංහළකමට කෙරෙන කෙණහිලිකම් ඉවසනු බැරිව කේ. එම්. පී. පාර්ලිමේන්තුව ඉදිරියේ උපවාසයක් ඇරඹීය.

" මාත් එක්ක උපවාසයට මහාචාර්ය එෆ්. ආර්. ජයසූරියත් ආවා. තිලක් රත්නකාර, ජේ. ආර්. පී. සූරියප්පෙරුම සහාය දුන්නා. මට ඇමතිකමයි, මන්ත්‍රීකමයි නැතිවුණා."

" ඉස්සර අපේ වාහනවල අංක තිබුණේ ඉංග්‍රීසි විදියට. **CE, CY, CL. CN** ආදී වශයෙන්. මේ අංක වෙනුවට 1 ශ්‍රී 1 න් පටන්ගෙන වාහන ලියාපදිංචිය ආරම්භ කළා. මේ ශ්‍රී අකුරු ගහපු වාහනවලට යාපනයේදී ශ්‍රී අකුර උඩ තාරගෑවා. සිංහළ භාෂාව රාජ්‍ය භාෂාව වූ සිංහල රටේ, 80% ක් සිංහලයෝ ඉන්න සිංහල රටේ සිංහළ අකුරුවලට දුෂ්ටයෝ කරපු අපහාසය ඒකයි. ඒක සිංහලකමට අභියෝගයක් බවත් අපට තේරුණා. එහෙම කරන්න උන්ට ඇති අයිතිය මොකක්ද? ලැබිච්ච හයිය මොකක්ද? "

" මං මගේ මන්ත්‍රීකම පැත්තකට දාලා වැලිමඩ පැත්තෙ කඩවල් වල තිබුණු දෙමළ අකුරුවල තාරගාලා විරෝධය පෙන්නුවා. අන්තිමේදි මට හිරබත් කන්නත් සිද්ධවුණා."

" වැලිමඩ වැනි නගරවලින් පටන්ගත්ත මෙම විරෝධතාවන්ට ලංකාවේ හැමෝම සහාය වුණා. උඩරට පළාත්වල නගරවල තිබුණේ දෙමළ ආධිපත්‍යය. මම දෙමළ ජනතාවට විරුද්ධ නැහැ. දෙමළ මිතුරන් මට ඉන්නවා. සමහර දෙමළ මන්ත්‍රීවරු පවා මට උදව්කළා. නමුත් දෙමළ ආධිපත්‍යය ඇති වෙනවට මම කැමතිවුනේ නැහැ.

මම වැලිමඩ මන්ත්‍රී කාලෙ වැලිමඩ මහා විද්‍යාලෙ විදුහල්පති දෙමළ. වැලිමඩ රෝහලේ ප්‍රධානියා දෙමළ. සෞඛ්‍යපරීක්ෂක දෙමළ. මම ඒ අයත් එක්ක සහයෝගයෙන් වැඩ කළා."

කේ. එම්. පී. රාජරත්න හා ඔහුගේ බිරිඳ කුසුමා රාජරත්නද මූලිකව ජාතික විමුක්ති පෙරමුණ යන නමින් පක්ෂයක් ඇති කළෝය. ඒ පක්ෂයෙන් වැලිමඩට රාජරත්න ද, ඌවපරණගමට කුසුමා ද තරඟ කළ අතර ඒ දෙදෙන ජයග්‍රහණය කළේ වැඩි ඡන්ද විශාල සංඛ්‍යාවලිනි.

වත්මන් අර්බුදය හා ඒ පිළිබඳව විසඳුම කුමක් දැයි මම කේ. එම්. පී. රාජරත්න මහතාගෙන් විමසුවෙමි.

" මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ප්‍රකාශ කළා වගේ මේ ත්‍රස්තවාදය හමුදා ක්‍රමයකින්ම විනාශකරන්න ඕන. ත්‍රස්තවාදයට බලහත්කාර-කමට දේශපාලන විසඳුම් නැහැ. එතුමා මේ බව වැනෙන්නෙ නැතුව කිව්වා. දෙමළ අය සාකච්ඡා ඉල්ලන්නෙ ඒ කාලය තුළ සන්නද්ධ වෙන්නයි. සිංහල අය පමණක් නෙවෙයි දෙමළ උගත් පිරිසත් මධ්‍යම පන්තියේ අයත් ජනාධිපතිවරයාගේ අදහස් පිළිගන්නවා."

" මේ ලංකාවෙ සිංහළ දෙමළ මුස්ලිම් අපි කාටත් එකට ඉන්න පුළුවන් රට. හැබැයි හොරෙන් හොරෙන් ආධිපත්‍යය වැඩිකරගන්න දඟලනවා නම් ඔවුන් එතැනම නැවැත්විය යුතුයි. එහෙම නැතුව රටක් ගෙනියන්න බෑ."

කේ. එම්. පී. රාජරත්න මහතා සමග පිළිසඳරේ යෙදීමට ඔහුගේ පුත්‍රයා මට අවස්ථාව ලබා දුන්නේ විනාඩි 15 කි. එහෙත් නොදැනීම මෙම පිළිසඳරට පැය 4 ක කාලයක් ගතවිය. ඒ තුළ පොතක් ලියන්නට තරම් රසවත්, එමෙන්ම වැදගත් අතීත දේශපාලන හා සාමාජීය සිදුවීම් මහා රාශියක් එළිදරව් වීය. අවසන මම රාජරත්න මැතිතුමන්ට නිදුක් නිරෝගී දිගාසිරි පතමින් සමුගතිමි. පුත්‍ර නාලක රාජරත්න මහතාට ද ස්තුතිවන්ත වෙමි.


රාජරත්න මහතා සමග මේ ඡායාරූපයේ සිටින්නේ සාකච්ඡාව කළ මේජර් කරුණාරත්නය

**මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**



## මේ ගඟක් නොව ගං වතුරෙන් යටවූ මහපාරකි

**ශ්‍රී** ලංකාවට කඩා වැටෙන, පහත්වන අතුරු ආන්තරා, විපත්ති, ව්‍යසන කෙළවරක් නැත. ත්‍රස්තවාදය එක පැත්තකින් තිබෙද්දී දැනට සති තුනකට පෙර වට මහා ධාරාණිපාත වර්ෂාව හේතුවෙන් ගංවතුරෙන් ලංකාවේ බොහෝ පළාත් යටවී ගියේය. ජීවිත ද හානි විය. අවතැන් වූවන්ගේ සංඛ්‍යාව හත්දහස් පන්සීයද ඉක්මවීය. වඩාත් හානි සුදුවූයේ කළුගඟ පිටාර යාම නිසා රත්නපුර ප්‍රදේශයටය. පස් කන්දක් කඩාවැටී සම්පූර්ණ ගෙයක්ම යටවීමෙන් කුඩා දරුවෙකුද ඇතුලුව එකම පවුලේ හතර දෙනෙක්ද අසල්වැසි කාන්තාවන් දෙදෙනෙකුද මරුමුවට පත්වූ බව ද අසන්නට ලැබිණ. නොකඩවා වැටුණු වැස්සට පාරවල්ද ගංගාවල් බවට හැරෙමින් තිබිණ. වලවේ ගඟ පිටාර ගැලීම නිසා බලන්ගොඩ රෝහලද වතුරට යටවී ඇත.